# පිළිසඳර
# PILISANDARA


2019
ජූලි/සැප්.
npassrilanka@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of the National Photographic Art Society of Sri Lanka











## ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2019

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ දශක හතක දිගු කීර්තිමත් ඉතිහාසයට තවත් ස්වර්ණමය සටහනක් එක් කරමින් සංගමය විසින් මෙහෙයවනු ලබන ඡායාරූප කලාව පිළිබඳව වූ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ 2016, 2017 සහ 2018 වසර සඳහා වූ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2019 ජූලි මස 20 වන දින කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍යය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ 03, සසකාවා සංස්කෘතික කේන්ද්‍රයේදී අති උත්කර්ෂවත් අයුරින් පවත්වනු ලැබිණි.

මෙහිදී පාඨමාලාව සාර්ථකව අවසන් කළ විද්‍යාර්ථයින් හතළිස් දෙදෙනෙකු වෙත ඩිප්ලෝමා සහතික ප්‍රදානය කළ අතර, මෙහි මුඛ්‍ය දේශනය ආචාර්ය ටියුඩර් වීරසිංහයන් විසින් **"යථාර්ථයේ සමුගන්නා ඡායාරූපය"** මැයෙන් පවත්වන ලදී.

මීට සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය මෙන්ම ඩිප්ලෝමාධාරීන්ගේ දෙමාපියන් ද සහභාගි වූහ. සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රවීන ඡායාරූපවේදී හා ටෙලිනාට්‍ය අධ්‍යක්ෂක දි.ග. සෝමපාල මහතා ද ඒ අතර විය.

මොහාන් ගුරුසිංහ, අයේෂා බුලත්ගම, ගගන් කරුණාචන්ද්‍ර, දෙව්මිණි ජයතිලක, ගිහාන් දුල්වල, චන්න මයුරංග, එස්. බී. අමරදාස, හසිත් ගීතාංජන යන විද්‍යාර්ථියන්ගෙන් සමන්විත ලක්ෂාන් මාපාගේ මූලිකත්වයෙන් යුත් කමිටුවක් විසින් ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සංවිධානය කළ අතර, ඒ සඳහා සංගමයේ සභාපති කංචන මාරසිංහ, විධායක අධ්‍යක්ෂ සමන් කුලසූරිය, වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂ ශාන්තිලාල් ප්‍රනාන්දු සහ ලේඛකාධිකාරී සාලිය ලියනගේ යන අධ්‍යක්ෂකවරුන්ගේ මඟ පෙන්වීම හිමිව තිබුණි.

# ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2019 ......




















## 43 වන ඡායාරූප ප්‍රදර්ශනය පිළිබඳ ගෝලීය දැනුවත් කිරීම ...

ගෝලීය ඡායාරූප සංගමයේ (The Global Photographic Union) 2019 Spring / Summer සඟරාවේ 10 වැනි නිකුතුවේ GPU ලෝක ඡායාරූප මධ්‍යස්ථාන ක්‍රියාකාරකම් යටතේ, එහි ශ්‍රී ලංකාවේ මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක ශ්‍රී ලංකා ඡායාරූප කලා සංගමයේ 43 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය පිළිබඳව වාර්තා කර තිබුණේ මෙසේය.

The Global Photographic Union හි ශ්‍රී ලංකාවේ අධ්‍යක්ෂක වරයා ලෙස කටයුතු කරන්නේ අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රවීණ ඡායාරූපවේදී **බන්දු ගුණරත්න මහතාය.**



Prepared by
Marija Milovanović Maksimović
GPU Secretary General

GPU NEWS & EVENTS

GPU COORDINATING CENTRES

GPU had built up friendly connections within group and individual photographers as of its first day was established, and continue to be a beacon for the photographic arts in the world. Our strategic planning and goals in upcoming years are to build up visibility and involvements in every region and country to promote art photography, our program for the photography community based on partnership connections, individuals and group. Our valued active members now benefiting from many activities and educational materials such as periodically publish GPU Magazine, biennial GPU Photography Book, Regular News Letters and worldwide Members Exhibition.

However, as a Community, we build up a cooperative and partnership with many Clubs and Groups, as this continues to cultivate worldwide, our collaboration and connections, as there are many demands for more activities to provide access to photography education and intercontinental connections between photographers. GPU opened many GPUWorld Photography Centers in different countries such as Azerbaijan, Morocco, Egypt, Saudi Arabia, India, Sri Lanka and UAE.

Those centres will playa a part in GPU future educational program promote photography by providing easy access to photography knowledge and developing skills as well as a counterpoint where amateur get provisional help.

Saeed Al Shams

China · Azerbaijan · Morocco

INTRODUCING THE NEW GPU COORDINATING CENTRE IN SRI LANKA

The National Photographic Art Society of Sri Lanka has been appointed to represent GPU World Photography Center in Sri Lanka and as a starting event the Society has organised their 43rd annual all island Exhibition of Photography recently. There had been 1670 digital entries under six categories out of which 167 works were selected by an eminent panel of selectors. The selected images were exhibited by means of prints at the J.D.A Perera Art Gallery, Colombo, SriLanka on 7th, 8th and 9th June 2019. The exhibition was declared open by a leading SriLankan cinematographer Mr.M.D.Mahindapala.

Bandu Gunaratne

16 / GPU Magazine Spring/Summer 2019.







# මහා බෝධි විද්‍යාලය පිළිසකර කිරීමේ ශ්‍රමදානය



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, පශ්චාත් කළමනාකරණ ආයතනය හා එක්ව, කොළඹ 10, මහා බෝධි විද්‍යාලයේ ක්‍රියාත්මක කළ ශ්‍රමදානය 2019 ජූලි මස 06 වන දින දවස පුරා පැවති අතර, ඊට ඡායාරූප පාඨමාලාව සඳහා සහභාගි වන විද්‍යාර්ථීන් 100 කට ආසන්න සංඛ්‍යාවක් තම ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී.


ඡායාරූප ශිල්ප පාඨමාලාව පවත්වා ගෙන යාම සඳහා දිගු කලක සිට සෙවන ලබාදෙන මහා බෝධි විදුහල් මාතාවගේ උන්නතිය උදෙසා විටින් විට සංගමය විසින් ඉටුකරනු ලැබූ මෙහෙවර අතර, මෙම ශ්‍රමදානය වඩාත් සුවිශේෂී වූවක් විය.

මෙහිදී මූලික වශයෙන් විද්‍යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ල සහ පිවිසුම් ප්‍රදේශය පිළිසකර කළ අතර, මීට මූලික වශයෙන් බරපැන සැපයීම පශ්චාත් කළමනාකරණ ආයතනය විසින් ඉටුකරන ලදී.

මෙම සද්කාර්යය සඳහා සම්බන්ධීකරණය, වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂ ශාන්තිලාල් ප්‍රනාන්දු මහතා සිදුකරනු ලැබූ අතර, ජ්‍යෙෂ්ඨ සාමාජිකා රත්නා විජේසිංහ මහත්මිය පිරිවැය සඳහා විශේෂ දායකත්වය ලබාදෙන ලදී.

සිප් සතර හදාරන විදුපියස පිළිසකර කිරීමේ කාර්යය, වර්තමාන විද්‍යාර්ථයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම මත ක්‍රියාත්මක කරන ලදී.








# අධ්‍යාපන

## විහාරමහා දේවී උද්‍යාන වැඩමුළුව



වාර්ෂිකව පවත්වනු ලබන විහාරමහා දේවී උද්‍යාන වැඩමුළුව මෙවරත් විද්‍යාර්ථීන් 125 ක ගේ සහභාගිත්වයෙන් 2019 ජූනි මස 30 වෙනි දින පැවැත්වූ අතර, ඊට සම්පත් දායකත්වය ජ්‍යෙෂ්ඨ සාමාජික හා හිටපු ප්‍රදර්ශන අධ්‍යක්ෂකවරයෙකු වූ නාරද අමරතුංග මහතා විසින් ලබා දෙන ලදී. (මෙම වැඩමුළුවේ ඡායාරූප තරගයට අදාළ ප්‍රතිඵල මාසික තරග ජයග්‍රහණ යටතේ පළවේ).

## වීදි ජන ජීවිතය ඡායාරූපකරණයට...



කලාත්මක සේම ආශ්වාදජනක අත්දැකීම් රැසක් කැමරා කාචයට සටහන් කිරීමට හැකිවූ වැඩමුළුවක් ජූලි මස 21 වන දින අග නගරය කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලද අතර, එහිදී වීදි ජන ජීවිතය ආවරණය කෙරන පරිදි ඡායරූපකරණයේ යෙදීමට ඊට සහභාගි වූ විද්‍යාර්ථියින්ට අවස්ථාව උදාවිය.

මෙය දෙවන වසර සඳහා පැවැත්වෙන වැඩමුළුවක් වුවද, මෙවර ඊට තෙවන වසර විද්‍යාර්ථීන්ද එක් විය. කේ. ජී. කීර්තිරත්න, ඩී.කේ. ලැන්ටි, උපනන්ද සෙනෙවිරත්න, නාරද අමරතුංග, ප්‍රියන්ත අබේසුන්දර සහ මධුරංග අබේවර්ධන යන ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

## කැලණි විහාර වැඩමුළුව

මෙවර කැලණි විහාර වැඩමුළුව 2019 ජූලි මස 28 වන දින පැවැත්වූ අතර, එහි සම්පත් දායකත්වය ඩී.කේ. ලැන්ටි, ගාමිණී ආර්. ෆොන්සේකා, ප්‍රේමසිරි හිදැල්ලආරච්චි හා මධුරංග අබේවර්ධන ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් විසින් ලබාදෙන ලදී.




## හෝර්ටන්තැන්න පසුබිම් කරගත් භූ දර්ශන හා වනජීවී ඡායාරූපකරණ වැඩමුළුව - 2019

සුන්දර හෝර්ටන් තැන්න පසුබිම් කරගත් භූ දර්ශන හා වනජීවී ඡායාරූප වැඩමුළුව දෙවන වරටත් 2019 අගෝස්තු මස 3 හා 4 වන දෙදින පුරාවට විද්‍යාර්ථීන් 40 කගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මෙහි සම්පත් දායකත්වය ප්‍රවීන භූ දර්ශන ඡායාරූපවේදී ප්‍රියන්ත බණ්ඩාර හා වනජීවී ඡායාරූපවේදී රෝහිත ගුණවර්ධන යන මහත්වරුන් විසින් සපයන ලද අතර, වැඩමුළුව අවසානයේදී සහභාගි වූවන් විසින් ගන්නා ලද ඡායාරූප ඇසුරෙන් තරගයක්ද පවත්වන ලදී.

මෙම වැඩමුළුව සඳහා වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් එම්.ජී.සී. සූරියබණ්ඩාර මහතා ලබාදුන් සහයෝගය මෙහිදී කෘතඥපූර්වකව සිහි කරන අතර, ප්‍රායෝගික කටයුතු සඳහා සහය වූ උද්‍යාන පාලක පී.කේ.පී.එම්. ප්‍රදීප් කුමාර මහතාගෙන් ලද සහයද වැඩමුළුවේ සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් විය.




### ඡායාරූප තරගයෙන් ජයගත් නිර්මාණ



රන් සම්මානය
පී.එල්.එස්.එන්. සෙනෙවිරත්න



ලෝකඩ සම්මානය
චාමර රණතුංග



රිදී සම්මානය
කේ.එච්.එච්. සඳමාලි

# අධ්‍යාපන

## පස්වන වරටත් වර්ණ කළමනාකරණය

මෙවර දෙවන වසර විද්‍යාර්ථීන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසා පවත්වනු ලබන වර්ණ කළමනාකරණය පිළිබඳව වූ වැඩමුළුව මෙවරත් අගෝස්තු මස 18 වන දින වැල්ලවත්තේ Debug Epson ආයතන ශ්‍රවනාගාරයේදී පැවැත්වූ අතර, සුපුරුදු පරිදි ඊට සම්පත් දායකත්වය සපයන ලද්දේ **නීල් කුරේ** මහතා විසිනි.

පස් වසරක් මුළුල්ලේ අඛණ්ඩව පවත්වාගෙන එනු ලබන මෙම වැඩසටහන උදෙසා සම්පත් දායකත්වය ලබාදෙන නීල් කුරේ මහතාට සහ පරිශ්‍රය ලබාදීමෙන් දැක්වූ අනුග්‍රහය වෙනුවෙන් Debug Epson ආයතනය වෙත වැඩමුළුව අවසානයේදී සංගමයේ ප්‍රණාමය පුදකිරීමට සමරු තිළිණ ලබාදීම සිදු කළ අතර, ඊට සංගමයේ විධායක අධ්‍යක්‍ෂක සමන් කුලසූරිය මහතා සහභාගි විය.

මෙම වැඩමුළුවද දෙවන වසර අධ්‍යාපන සම්බන්ධීකාරක ප්‍රේමසිරි හිදැල්ලආරච්චි මහතාගේ සංවිධායකත්ව මෙහෙවරකි.






# අපේ විත්ති

## මොහාන් ගුරුසිංහට ජයග්‍රහණ රැසක්



අප සංගමයේ ක්‍රියාකාරී සාමාජික මොහාන් ගුරුසිංහ විසින් අන්තර්ජාතික ඡායාරූප තරග සඳහා ඉදිරිපත් කළ නිර්මාණ සඳහා ජයග්‍රහණ රැසක් හිමි වී ඇත.

ඔස්ට්‍රියාවේ පැවැත්වූ 28 වන ට්‍රයින්බර්ග් සුපර් සර්කිට් තරගය සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ "Thrilling" ඒකවර්ණී ඡායාරූපයට සඳහා FIAP රන් සම්මානය හිමිවූ අතර, ඇමෙරිකාවේ නිව්යෝර්ක් හි NYC Exhibition Manhattan තරගය සඳහා ඉදිරිපත් කළ "Yellow Taxi" ඡායාරූපය සඳහා FIAP රන් සම්මානය හිමිවිය.

මීට අමතරව ජපානයේ පැවති 79 වන අන්තර්ජාතික ඡායාරූප තරගය සඳහා "Foot ball fever' යන ශීර්ෂය යටතේ ඉදිරිපත් කළ ඒකවර්ණී ඡායාරූපය ගෞරව සම්මානයට පාත්‍ර විය.










මෙයට අදාළ සම්මානය මොහාන් වෙත තරග තීරක වරියක් වූ අංජු මෙනවිය විසින් පිරිනමන අවස්ථාව.

## රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ සභාපති ධුරය සිතුමිණ රත්නමලලයන්ට......



අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික, හිටපු අධ්‍යාපන අධ්‍යක්‍ෂකවරයෙකු වූ මොරටුව විශ්වවිද්‍යාලයේ සමෝධානික නිර්මාණ අධ්‍යයන අංශයේ වාස්තු විද්‍යා පීඨයේ අධ්‍යයන අංශ ප්‍රධානී සිතුමිණ රත්නමලල මහතා රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ සභාපති ධුරයට පත්වී ඇත.

ඔහුගේ සභාපතිත්වයෙන් මෙවර 2019 ජාතික ඡායාරූප උළෙල අගෝස්තු 19 වෙනි දින ජාතික චිත්‍රපට සංස්ථාවේ තරංගනී සිනමා ශාලාවේදී පැවති අතර, ඊට සමගාමීව අගෝස්තු 23 - 25 දින දක්වා ඡායාරූප ප්‍රදර්ශනය "Bright Exposure" නමින් කොළඹ, ජේ.ඩී.ඒ. පෙරේරා අනුස්මරණ කලාගාරයේදී පැවැත්විණි.

# ප්‍රදර්ශන

## 43 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය මහනුවරට ....

කන්ද උඩරට වෙසෙන ඡායාරූප ශිල්පයට ඇලුම්කරන්නන් හට නැවුම් අත්දැකීමක් එක්කරමින් ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 43 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනයේ සියලු නිමැණ ඇතුළත් ඡායාරූප ප්‍රදර්ශනය ජූලි මස 27 හා 28 දෙදින මහනුවර පුෂ්පදාන ශාලාවේදී පැවැත්වූ අතර, එහි සමාරම්භය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයේ මහාචාර්ය රංජිත් පල්ලෙගම මහතා අතින් සිදු විය. මහනුවර Salon Indu & Mala Saree (Pvt) Ltd. හි අධ්‍යක්ෂක මංජුල හරස්ගම මහතා විශේෂ ආරාධිතයෙකු ලෙස මීට සහභාගී විය.

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති කංචන මාරසිංහ හා විධායක අධ්‍යක්ෂ සමන් කුලසූරිය මහත්වරුන් ප්‍රමුඛව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් රැසක්ද සහභාගිවූ අතර ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය නියෝජනය කරමින් ප්‍රවීන ඡායාරූපවේදී චන්ද්‍රසේන පෙරේරා මහතා, රත්නා විජේසිංහ මහත්මිය, රංජනී අරංදර මහත්මිය, හිටපු ප්‍රදර්ශන අධ්‍යක්ෂවරුන් වූ නාරද අමරතුංග සහ උදේනි අල්විස් යන මහත්වරුන් ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් රැසක්ද සහභාගි වූහ. මහනුවර ප්‍රදේශයේ ක්‍රියාත්මක කඳුරට ඡායාරූප සංගමය සහ සෙංකඩගල ඡායාරූප කවය නිලධාරීන්ද, ප්‍රදේශයේ කලාකරුවන් රැසක්ද මේ සඳහා සහභාගි වී සිටිනු දක්නට ලැබුණි.

මෙම සමාරම්භක මොහොතට සමගාමීව ප්‍රවීන භූ දර්ශන ඡායාරූපවේදී ප්‍රියන්ත බණ්ඩාර මහතා විසින් භූ දර්ශන ඡායාරූපකරණය පිළිබඳව ප්‍රායෝගික දේශනයක් පවත්වන ලදී. ප්‍රදර්ශන අධ්‍යක්ෂ සංඛ සම්මාන පෙරේරා මහතාගේ අධීක්ෂණය හා සංවිධායකත්වයෙන්, සංගමයේ විද්‍යාර්ථීන් රැසකගේ දැවැන්ත කැපවීමෙන් ප්‍රදර්ශනය සාර්ථකත්වයට පත්විය.










# අපේ විත්ති

## CROSSING BRIDGES ඡායාරූප ශිල්පී හමුව මෙවර පිලිපීනයේ මැනිලා නුවර දී.........



"ක්‍රොසිං බ්‍රිජස්" ආසියානු ඡායාරූප ශිල්පීන්ගේ වාර්ෂික සංචාරක හමුව මෙවර අප්‍රේල් මස 25 දින සිට මැයි 02 වන දින දක්වා පිලිපීනයේ මැනිලා නුවර දී පැවැත්වීමට පිලිපීන ඡායාරූප සම්මේලන පදනම කටයුතු සංවිධානය කර තිබුණි. මෙහි මූලිකත්වය පිලිපීන සම්මේලනයේ සභාපති **ඉඩියුවිශේස් හුවැංග් මහත්මිය** දැරූ අතර, ඊට රටවල් 09 ක් නියොජනය කරමින් වෘත්තීය හා ආධුනික ඡායාරූප ශිල්පීන් 120 ක් පමණ සහභාගි වූහ.

2004 වර්ෂයේදී සිංගප්පූරු හා ඉන්දුනීසියානු ඡායාරූප ශිල්පීන් කණ්ඩායම් දෙකකින් ඇරඹුණු මෙම සංවිධානයට පසුව මැලේසියාව, පිලිපීනය, වියට්නාමය, ශ්‍රී ලංකාව, කොරියාව හා තායිවානය එක් වූ අතර, මේ වසරේදී නව සාමාජික රටක් ලෙස ඕස්ට්‍රේලියාව ඊට එක්විය.

පසුගිය වසර වලදී මැකාවෝ, ඉන්දුනීසියාව, පිලිපීනය, වියට්නාමය, මලයාසියාව, සිංගප්පූරුව, කොරියාව, තායිවානය. චීනය සහ ශ්‍රී ලංකාව මෙම වැඩසටහන තම රටේදී සංවිධානය කර ඇත.






මෙවර වැඩසටහන සඳහා ද ශ්‍රී ලංකාවේ ක්‍රොසිං බ්‍රිජ් කණ්ඩායමේ නායක ප්‍රවීන ඡායාරූප ශිල්පී බන්දු ගුණරත්නයන්ගේ නායකත්වයෙන් අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් කිහිප දෙනෙකු ද ඇතුළත්ව ශිල්පීන් දහඅට දෙනෙකු සහභාගි විය. "ක්‍රොසින් බ්‍රිජ්" ලබන වසරේදී උතුරු වියට්නාමයේ දී පැවැත්වීමට සංවිධායක මඩුල්ල තීරණය කර ඇත.

## 2019 මාර්තු මස මාසික තරගය





**ඒක වර්ණ**
1. අරුණ ප්‍රභාත්
2. සමීර කොතලාවල
3. ඉරෝෂාන් බණ්ඩාර
4. ධනංජය චතුරංග
5. රවීන්ද්‍ර ලක්සිරු

**වර්ණ**
1. සමීර කොතලාවල
2. චාමර රණතුංග
3. අරුණ ප්‍රභාත්
4. තිලක්ෂි වීරකෝන්
5. චතුර ජයලත්

**තරග විනිශ්චය**
කේ.ජී. කීර්තිරත්න මහතා, ප්‍රියන්ත අබේසුන්දර මහතා,
යමුනි රශ්මිකා මහත්මිය,

## 2019 අප්‍රේල් මාසික තරගය





**ඒකවර්ණ**
1. එම්.ඒ. අරුණ ප්‍රභාත්
2. ප්‍රදීප් ලක්ශ්‍රී මල්ලිකාරච්චි
3. අනුදි නිසල්යා
4. ප්‍රදීප් ලක්ශ්‍රී මල්ලිකාරච්චි
5. ඒ.එල්.පී.ආර්. හර්ෂණ

**වර්ණ**
1. ඩබ්.එච්. නවෝදා සංජීවනී
2. තරිඳු ප්‍රියංග නවරත්න
3. එම්.ඒ. අරුණ ප්‍රභාත්
4. ආර්.එච්.ඒ.ආර්.ඩී.එල්. රණසිංහ
5. ආර්.එච්.ඒ.ආර්.ඩී.එල්. රණසිංහ

**තරග විනිශ්චය**
ප්‍රියන්ත අමරසිංහ මහතා, ඩී.කේ. ලැන්ට් මහතා, සම්පත් පීරිස් මහතා

## 2019 ජූනි මාසික තරගය






**ඒකවර්ණ**
1. නුවන් වික්‍රමපාල
2. සමීර කොතලාවල
3. ප්‍රදීප් ලක්ශ්‍රී මල්ලිකාරච්චි
4. ඩබ්.එම්. කලණ විජේසුන්දර
5. ඒ.එම්.ආර්.කේ. අතපත්තු

**වර්ණ**
1. තිලක්ෂි වීරකෝන්
2. අයි.කේ. හේෂාන් තරින්දු දයානාත්
3. සමීර කොතලාවල
4. නදීක ප්‍රියදර්ශන
5. තිලක්ෂි වීරකෝන්

**තරග විනිශ්චය**
කංචන මාරසිංහ මහතා ප්‍රියන්ත අබේසුන්දර මහතා,
අමන්දා සමානි මහත්මිය

## 2019 ජූලි මාසික තරගය





**එකවර්ණ**
1.කේ.ඒ.ඒ. තුෂාර කළුනායක
2.සමීර කොතලාවල
3.නිපුල් සිල්වා
4.සමීර කොතලාවල
5.චාමර රණතුංග

**වර්ණ**
1. ජේ.ඒ. රජිත තිලංක
2. සමීර කොතලාවල
3. නුවන් වික්‍රමපාල
4. චාමර රණතුංග
5. නුවන් වික්‍රමපාල

**තරග විනිශ්චය**
නාරද අමරතුංග මහතා, කේ.ජී. කීර්තිරත්න මහතා,
විරාජ් ලියනාරච්චි මහතා

## 2019 අගෝස්තු

**විහාරමහා දේවි උද්‍යාන ඡායාරූප වැඩමුළුව - ඩී.පී. වීරවර්ධන ශූරතාව**





**ඒකවර්ණ**
1. නුවන් වික්‍රමපාල
2. නිපුල් සිල්වා
3. ඉරෝෂන් බණ්ඩාර
4. ඒ. මොහාන්දාස්
5. ප්‍රදීප් ලක්ශ්‍රී මල්ලිකාරච්චි

**වර්ණ**
1. සමීර කොතලාවල
2. තිලක්ෂි වීරකෝන්
3. සමීර කොතලාවල
4. චාමර රණතුංග
5. කේ.ඒ.ඒ. තුෂාර කළුනායක

ඩී.පී. වීරවර්ධන ශූරතාව - නුවන් වික්‍රමපාල

**තරග විනිශ්චය**
ප්‍රියන්ත අමරසිංහ මහතා, ඩී.කේ. ලැන්ට් මහතා,
හර්ෂ මධුරංග ජයසේකර මහතා.

## අපගේ ශෝකය

අපගේ යාවජීව සාමාජික විජිත වික්‍රමරත්න මහතාගේ (L.M.90) දයාබර මෑණියන්,
අප සංගමයේ සාමාජික, කඳුරට ඡායාරූප සංගමයේ සභාපති අජිත ජයතිලක මහතාගේ දයාබර පියාණන්,
සහ
අප සංගමයේ සාමාජික මනෝජ් වෙලබොඩ මහතාගේ දයාබර පියාණන්ගේ
අභාවයන් පිළිබඳව
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සමස්ථ සාමාජිකත්වයේ ශෝකය පුදකරන්නෙමු.

## ප්‍රකාශන පුවත්

### ඔබේ තොරතුරු පිළිසඳරට ලියන්න.

ඔබේ ඡායාරූප දිවියේ ජයග්‍රහණ, වැදගත් කඩඉම්, සංගමයේ සාමාජිකයින් සමග බෙදාගන්නට පිළිසඳරට යොමුකරන්න.

**ගරු ප්‍රකාශන අධ්‍යක්ෂක,**
**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,**
නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.
E-mail: npassrilanka@gmail.com

**සියලු තොරතුරු සඳහා**

**සංගමයේ නිල වෙබ් අඩවිය**
www.npassrilanka.org
**වෙත යොමු වෙන්න**

### ඔබ් ඔබටමයි......

ඔබ සංගමයේ
සාමාජිකත්වය සුරැකීම
ඔබට
මෙන්ම සංගමයට ද
අත්‍යවශ්‍ය වූවකි.
එබැවින් සාමාජික මුදල්
නිසි ලෙස ගෙවීමෙන්
ඔබට
ඒ සඳහා සහය විය හැක.

## සංගමයේ කෙටි පණිවිඩ ඔබට එනවාද?

සංගමයේ නිල නිවේදන සාමාජික හට ලබාදීම අරමුණුකොට පවත්වාගෙන යන කෙටි පණිවිඩ සේවාව (sms alert) සමග ඔබ සක්‍රීය වී නොමැති නම් නොපමාව ප්‍රකාශන අධ්‍යක්ෂ අමතා ඒ බව දැනුම් දෙන්න. එමගින් සංගමයේ නිල කටයුතු පිළිබඳව ඔබට ඉක්මණින් දැනුවත් වීමේ අවස්ථාව උදාවනු ඇත.




### The Beauty of Sri Lanka - 2019

ලාංකික විචිත්‍රත්වය ලොවට ගෙන යන අපේ කට්ටියට උණුසුම් සුබපැතුම්!

ඇමෙරිකා- ශ්‍රී ලංකා ඡායාරූප කලා සංගමය විසින් 2019 සැප්තැම්බර් මස 21 - 27 දක්වා ලොස් ඇන්ජලීස් හී කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ දී පවත්වනු ලබන The Beauty of Sri Lanka - 2019 ඡායාරූප ප්‍රදර්ශනයට සහභාගි වන අප සංගමයේ කේ.පී. කීර්තිරත්න, යමුනි රශ්මිකා, රෝහිත ගුණවර්ධන, විකුම් සේනානායක සහ රංජනී පෙරේරා යන සාමාජික සාමාජිකාවන්ට මෙන්ම ඊට සහභාගිවන සියලුම ලාංකීය නිර්මාණ ශිල්පීන් ට ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ උණුසුම් සුබපැතුම් පිරිනමන්නෙමු.

### ඉදිරි පිළිසඳර කලාපය තුළින් ඔබට ...

* 66 වන මහා සභා රැස්වීම
* පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය - 2018 සඳහා සහතික පත් ප්‍රදානය
* ප්‍රවීන ඡායාරූපවේදී හෙන්රි රාජකරුණා මහතාගේ තුන්වන ඡායාරූප ප්‍රදර්ශනය Another World Unveiled.
* තෙවෙනි ඇස Photo Fair හී NPAS සහභාගිත්වය
* 43 වන ඡායාරූප ප්‍රදර්ශනය - ත්‍රිකුණාමලයට

### විශේෂ මහා සභා රැස්වීමක්....

**66 වන මහා සභා රැස්වීමේදී තීරණය කර ගත් පරිදි 2019 සැප්තැම්බර් 29 වන දින පෙරවරු 9.00 ට කොළඹ 10, මහා බෝධි විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේදී ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.**

**ඒ සඳහා සහභාගිවීමට සමස්ත සාමාජිකත්වයට ගෞරවයෙන් ආරාධනා කර සිටින්නෙමු.**

**- අධ්‍යක්ෂ මණ්ඩලය -**

**විශේෂ ස්තූතිය**
* අධ්‍යක්ෂ මණ්ඩලය,
* මනුජිත් කටුගම්පල, උවිඳු ලොකුලියන සහ ඡායාරූප සැපයූ සහෘදයින් සැමට.

# පිළිසඳර

සටහන හා සැකසුම :
ප්‍රදීප් එන්. වෙදගෙදරවත්තේ
රූ රටා සහ ග්‍රැෆික් නිර්මාණය :
නදී ග්‍රැෆික්ස් - පානදුර.

මුද්‍රණය :
නිව් සංහිඳ ප්‍රින්ටර්ස්
මාදුපිටිය, පානදුර.

QD/195/NEWS/2019

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ.